සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. ජන සන්නිවේදනය තුළ දැකිය හැකි ලක්ෂණයකි.
    1. කුඩා කණ්ඩායම් ඉලක්ක කරගෙන සන්නිවේදනය සිදු කිරීම.
    2. ඉලක්ක ගත ග්‍රාහකයින් වෙතටම පණිවිඩය ලබාදිය හැකි වීම.
    3. මාධ්‍ය පරිහරණය සඳහා විශේෂ සාක්ෂරතාවයක් අවශ්‍ය නොවීම.
    4. ජනමාධ්‍යයෙන් ලබාදෙන සංදේශ නිශ්චිතවම කුමන ග්‍රාහකයෙක් ලබාගත්තේදැයි සන්නිවේදකයා නොදැනීම.
    5. ජනමාධ්‍ය පරිහරණය කරන සියලු ග්‍රාහකයින් ශ්‍රාවකයන් ලෙස හැඳින්වීම.

02. සන්නිවේදනය ජන සන්නිවේදනය බවට පත්වන්නේ,
    1. දෙදෙනෙකු අතර පණිවිඩයක් හුවමාරු වන විටය.
    2. විදේශ ප්‍රවෘත්ති ඒජන්සිවලින් තොරතුරු ලැබෙන විටය.
    3. විවිධ සංදේශ ජන මාධ්‍යයෙන් ප්‍රචාරය වන විටය.
    4. සිදුවීම්, තොරතුරු ශබ්ද විකාශන යන්ත්‍රයෙන් ප්‍රචාරය කරන විටය.
    5. පරිගණක හෝ අන්තර්ජාලය ආශ්‍රයෙන් තොරතුරු හුවමාරු කර ගන්නා විටය.

03. පන්තිකාමර ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි අකමැත්තක් දැක්වූ ශිෂ්‍යයෙකු සමග උපදේශනය භාර ගුරුතුමිය බොහෝ වේලාවක් සුහදව කථාබහේ යෙදී සිටියාය. '' උපදේශනය,
    1. අන්තර්පුද්ගල සන්නිවේදනයේ අරමුණකි.
    2. පුද්ගලයා තුළ සිදුවන ආත්ම භාෂණයකි.
    3. පුද්ගල චර්යාවන් උපහාසයට ලක් කරන්නකි.
    4. වාචික සන්නිවේදනය පමණක් යොදා ගන්නා ක්‍රියාවලියකි.
    5. අවිධිමත් සන්නිවේදනයේ ඕපාදූප දාමයට අයත් වන්නකි.

04. සන්නිවේදන බාධක යනු, සන්නිවේදන ක්‍රියාවලියේ දී,
    1. නිවේදකස්ථානය මගින් සිදුවන දෝෂයයි.
    2. පණිවිඩය හා මාධ්‍යයේ දෝෂ නිසා නිසි පරිදි පණිවිඩය නොලැබීමයි.
    3. ග්‍රාහකයාගේ යම් යම් අපහසුතා නිසා පණිවිඩය නිසි පරිදි තේරුම් නොගැනීමයි.
    4. බාහිර පරිසරයෙන් එල්ලවන ඝෝෂාකාරී තත්වයයි.
    5. සන්නිවේදකයා, පණිවිඩය, මාධ්‍ය හා ග්‍රාහකයා යන සිව් වැදැරුම් අංශයන්හි බිඳවැටීමක් නිසා සන්නිවේදන ක්‍රියවලියට බලපෑමක් ඇති වීමයි.

05. සන්නිවේදන විධි පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් අසත්‍ය වන්නේ,
    1. ලැස්කෝව්, අල්ටාමීරා ගුහා චිත්‍ර දෘෂ්‍ය සන්නිවේදනයට දිගු ඉතිහාසයක් ඇති බව පෙන්වයි.
    2. විධිමත් සන්නිවේදනය ඉහළ සිට පහළට ද හරස් අතට ද ක්‍රියාත්මක වේ.
    3. අවාචික සංඥා වලට වඩා වාචික සංඥා කාර්යක්ෂම වේ.
    4. භාෂාවේ නව ස්වරූපයන් නව මාධ්‍ය හරහා නිර්මාණය වෙමින් පවතී.
    5. හදිසි අවස්ථා පිළිබඳ සන්නිවේදනය කිරීමේදී ශ්‍රව්‍ය සන්නිවේදනය වැදගත් වේ.

06. ජන මාධ්‍ය වාර්තාකරණයේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ,

A. පුරවැසියන් විසින් මාධ්‍ය වාර්තාකරණයෙහි යෙදේ.
B. ප්‍රධාන ධාරාවට පරිබාහිරව ක්‍රියාත්මක වේ.
C. ග්‍රහක කණ්ඩායම කුඩා වුවත් බලපෑම වැඩිය.
D. සමාජයේ දැවෙන ප්‍රශ්න විෂය පථය වේ.
E. සමාජ අරමුණු ඉටු කරගැනීම වෙනුවෙන් ක්‍රියා කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් පුරවැසි මාධ්‍යයේ ලක්ෂණ වන්නේ,

1. A, D හා E ය.  2. A, B හා C ය.  3. B, C හා D ය.
4. A, C හා D ය.  5. B, D හා E ය.

07. පෙර දිනයේ ජපානයේ සිදුවූ භූමිකම්පාව පිළිබඳව තොරතුරු අන්තර්ජාලය ඇසුරින් දැනගත් සුරනි, ජපානයේ වෙසෙන සිය සොයුරාට වහාම දුරකථන ඇමතුමක් ලබාගෙන ඔහුගේ සුවදුක් විමසා බැලිය යුතු යැයි සිතුවාය. එය,

1. අන්තර්පුද්ගල සන්නිවේදනයයි.  2. ජන සන්නිවේදනයයි.
3. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි.  4. අවාචික සන්නිවේදනයයි.
5. දෘෂ්‍ය සන්නිවේදනයයි.

08. රටක සන්නිවේදනය හා මාධ්‍ය හැසිරවීමේදී රජය මෙන්ම ජන මාධ්‍ය හා ග්‍රාහකයා ද සමාජය කෙරෙහි වගකීමෙන් කටයුතු කළ යුතු බව කියැවෙන්නේ,

1. අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේ ය.
2. නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පයේ ය.
3. සෝවියට් සමාජවාදී සන්නිවේදන සංකල්පයේ ය.
4. සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පයේ ය.
5. ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පයේ ය.

09. තාක්ෂණික ක්‍රම භාවිතා කොට අප යම් පණිවිඩයක් සම්ප්‍රේෂණය කළ ද මානවයා අවසානයේදී ග්‍රහණය කරගන්නේ පංචේන්ද්‍රිය තුළිනි. මෙම කියමන සනාථ කරමින් පුද්ගලයා සතු පංචේන්ද්‍රියන් නාලිය ලෙස විග්‍රහ කර ඇත්තේ,

1 ශැනෝන් - වීවර් ආකෘතියෙනි.  2. ලැස්වෙල් ආකෘතියෙනි.
3. ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතියෙනි.  4. බර්ලෝ ආකෘතියෙනි.
5. ද්වි මාර්ගික ආකෘතියෙනි.

10. බොහෝ විද්‍යාත්මක නියමයන් සොයා ගැනීමේදී මුලික වශයෙන් භාවිතා කොට ඇත්තේ,

1. ස්ව සංකල්පයයි.  2. තාර්කික චින්තනයයි.  3. ඵලදායී කථනයයි.
4. ආචාරශීලිත්වයයි.  5. සම්මුඛ සාකච්ඡාවයි.

11. පුද්ගලයන් තුන්සියක් පමණ අතුරුදහන් කරවමින් ඊයේ රාත්‍රියේ සිදුවූ නායයෑම පිළිබඳ පුවත අද පුවත්පත්වල ප්‍රමුඛ පුවත ලෙස වාර්තා වී තිබිණි. එය,

1. ප්‍රවෘත්ති වාර්තාකරණයේ කාර්යක්ෂමභාවය පෙන්වන්නකි.
2. කාලීන පුවත් වාර්තා කිරීමකි.
3. දෘඩ පුවත් වාර්තා කිරීමකි.
4. මෘදු පුවත් වාර්තා කිරීමකි.
5. ගවේෂණාත්මක පුවත් වාර්තා කිරීමකි.

12. 'ප්‍රජානනය' යන්නට අයත් වන්නේ,

1. සංජානනය, චින්තනය හා තේරුම් ගැනීමයි.
2. හැඟීම්, සිතුවිලි හා චර්යාවයි.
3. කායික, ස්වභාවය, හැකියාවන් හා සමාජ පිළිගැනීමයි.
4. ගැටළු, විකල්ප තීරණ හා තක්සේරු කිරීමයි.
5. අර්ථ ගැන්වීම, තර්කානුකුල බව සහ ප්‍රශස්ථ තීරණ ගැනීමයි.

13. කාලය ඉඩ හා අවකාශය මුදලට විකිණෙන අවස්ථාවකි,
1. පෝස්ටර් සහ අත් පත්‍රිකා 2. මාධ්‍ය සාකච්ඡා 3. අනුග්‍රාහකත්වය
4. ජන මාධ්‍ය වෙළඳ දැන්වීම් 5. බැනර්, කටවුට්

14. තදාත්මීකරණය මගින් පුද්ගලයෙකු සමාජානුයෝජනය වන්නේ,
1. සාමාජය අපේක්ෂා කරන ගති ලක්ෂණ අනුකරණය කිරීමෙනි.
2. ලෝක ප්‍රකට චරිත ආරෝපණය කර ගැනීමෙනි.
3. මාධ්‍ය තුළ චරිත අනුකරණය කිරීම තුළිනි.
4. තමන් ආශ්‍රය කරන පුද්ගලයෙකුගේ බොහෝ ගති ලක්ෂණ තමන්ට අරෝපණය කර ගැනීමෙනි.
5. තමන් කැමති ආකාරයට සමාජානුයෝජනය වීමෙනි.

15. අදහස් හා සිතිවිලි, සංඥා හෙවත් පණිවිඩයක් බවට පත්කිරීම හඳුන්වන්නේ,
1. ආකේතිකරණයයි. 2. විකේතිකරණයයි. 3. සංජානයයි.
4. අර්ථ ගැන්වීමයි. 5. ප්‍රතිපෝෂණයයි.

16. ස්ව - සංකල්පය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. උපතින්ම පුද්ගලයා සතුවේ.
B. අන් අය සමග අන්තර් ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වේ.
C. සන්නිවේදන ක්‍රියාවලිය හේතුකොටගෙන වර්ධනය වේ.
D. තමා කුමන ආකාරයේ පුද්ගලයෙකු ද යන්න පිළිබඳ ව කාලානුරූපීව තේරුම් ගනී.

ඉහත ප්‍රකාශ අතුරෙන් ස්ව - සංකල්පය පිළිබඳ සාවද්‍ය වන්නේ,
1. A පමණකි. 2. B පමණකි. 3. C පමණකි.
4. B හා C පමණි. 5. B, C සහ D පමණකි.

17. මිනිසා පරිසරයේ කොටස්කරුවෙකු ලෙස සිතීමට පොළඹවන්නේ,
1. දැනුම් සමාජය තුළය. 2. දියුණු විද්‍යා තාක්ෂණ ලෝකය තුළය.
3. බටහිර සමාජය තුළය. 4. ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥාණය තුළය.
5. කාර්මීකරණ ක්‍රියාවලිය තුළය.

18. ජනමාධ්‍ය ඔස්සේ ''නිසරුසංදේශ'' බහුල ලෙස සමාජ ගතවන්නේ,
1. රූප මාධ්‍යයේ ඇති ප්‍රබලත්වය නිසාය.
2. ශ්‍රව්‍ය මාධ්‍යයේ ඇති ප්‍රබලත්වය නිසාය.
3. නර්තන, ගායන, වාදන වලින් පිරී ඇති නිසාය.
4. විවිධ සංදේශ ඉඳුරන් පිනවීම නිසාය.
5. අවිචාරවත් ලෙස මාධ්‍ය ක්‍රියාත්මක වීම නිසාය.

19. මුද්‍රිත මාධ්‍ය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1. මුද්‍රිත මාධ්‍ය මුද්‍රණ කර්මාන්තය හා බැඳී පවතී.
2. මුද්‍රිත මාධ්‍ය දැන්වීම්කරණය සඳහා භාවිතා වේ.
3. විචාර කලාවට වඩාත් සුදුසු මුද්‍රිත මාධ්‍ය නිර්මාණයන්ය.
4. මුද්‍රිත මාධ්‍ය ප්‍රධාන වශයෙන් පාඨනය මුල්කොට ගෙන ක්‍රියාත්මක වේ.
5. මුද්‍රිත මාධ්‍ය වඩාත් වැදගත් ළමා සාහිත්‍යකරණය සඳහාය.

20. ගුවන් විදුලි මාධ්‍ය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. ශ්‍රවනය මත පදනම් වු ක්‍රියාවලියකි.
B. සන්දේශයන් පිළිබඳ ශ්‍රාවකයා තුළ ඇත්තේ අර්ධ අවධානයකි.
C. ගුවන් විදුලි සංදේශකරණය සඳහා භාෂාව වැදගත් සාධකයක් නොවේ.
D. සියලුම වයස් සීමාවන්ට ගැළපෙන සන්දේශකරණය අභියෝගාත්මකය.

1. A, B, D නිවැරදිය. 2. A, B, පමණක් නිවැරදිය. 3. A, C, D නිවැරදිය
4. සියල්ලම නිවැරදිය. 5. ඉහත ප්‍රකාශ කිසිවක් නිවැරදි නොවේ.

21. ගෝලීයකරණ ප්‍රවණතාවයක් නොවන්නේ,
1. ජාතික රාජ්‍ය දුර්වල වීම.
2. ගෝලියකරණය සමඟ කලාපීයකරණය සිදුවීම.
3. විවිත්‍ර සංස්කෘතියක් ඇතිවීම.
4. මාධ්‍ය සංස්කෘතිය බිහිවීම.
5. ද්‍රව්‍යමය ආර්ථිකය අභිබවා, මූල්‍යමය ආර්ථිකය ශක්තිමත් වීම.

22. අප වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය හා අනුගත වීමට නම්,
1. මාධ්‍ය අධ්‍යාපනය හොඳින් ලබාගත යුතුය.
2. මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කරගත යුතුය.
3. නූතන මාධ්‍ය භාවිතය පිළිබඳ දැනුවත් විය යුතුය.
4. පුද්ගල න්‍යාය පත්‍ර මාධ්‍ය පාලනයට නතු නොවන ආකාරයට සකස් කරගත යුතුය.
5. ඉහත කරුණු සියල්ල පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගත යුතුය.

23. මතකය රඳාපවතින්නේ මොළයේ ශක්ති ප්‍රමාණය අනුවය. මොළයේ දකුණුපස හා වම්පස ක්‍රියාත්මක වන ආකාරය මනෝ විද්‍යාඥයින් සොයාගෙන ඇත. ඒ අනුව මොළයේ වම්පස ක්‍රියාවලියට අයත් වන්නේ,
1. බුද්ධිමය විශ්ලේෂණයයි. 2. මුහුණේ ඉරියව්ය. 3. නිර්මාණශීලිත්වය.
4. කලාත්මක ක්‍රියාකාරකම්ය. 5. සංගීතමය හැකියාවයි.

24. සමූහ සන්නිවේදනයේ දී ඇතිවන කණ්ඩායමක් නොවන්නේ,
1. ඉගෙනුම් කණ්ඩායම් 2. විශෝධන කණ්ඩායම් 3. අහඹු කණ්ඩායම්
4. ගවේෂණාත්මක කණ්ඩායම් 5. ක්‍රියාකාරී කණ්ඩායම්

25. අන්තර් පුද්ගල සන්නිවේදයේදී ශ්‍රාවකයා කලයුතු යැයි ඔබ සිතන්නේ,
1. ප්‍රශ්න අසමින් කරුණු නිරවුල් කර ගැනීමයි.
2. හුම්ටි තබමින් මනා අවධානයක් යොමු කිරීමයි.
3. කාලය පිළිබඳ පීඩනයක් ඇති නොකිරීමට වගබලා ගැනීමයි.
4. කථකයාගේ අවස්ථාව ආක්‍රමණය නොකිරීමට වගබලා ගැනීමයි.
5. තමාට මතුවන ගැටළු කතා කරන මෙහොතේම නිරවුල් කර ගැනීමයි.

26. මාධ්‍ය දිනයක් උසස් අන්දමින් පැවැත්වීමට සංවිධානය කරගත් සිසුහු අදාළ වැඩ කොටස් එකිනෙකා අතර බෙදාගත්හ, කුමාරිට පැවරී ඇති කාර්යය පමණක් නොව අවශ්‍ය වූ සෑම විටකදීම අන් අයට ද සහාය විමට ඇය අමතක නොකළාය. මෙ මගින් දැකිය හැකි වන්නේ ඇය තුළ තිබූ,
1. ප්‍රජාතන්ත්‍රීය බව 2. සහානුභූති බව 3. වගවීම
4. වගකීම් සහිත බව 5. නායකත්ව ලක්ෂණ

27. සන්නිවේදන නියාමනයන් ජන සමාජයට අත්‍යවශ්‍ය වේ. නියාමනයන් සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. සන්නිවේදනයේ සමාජ පරමාර්ථයන් මුදුන්පත් කරගැනීම නියාමනයේ පරමාර්ථයයි.
2. විවිධ නියාමනයන් සමාජ සන්නිවේදනය කෙරෙහි ඇති කරන්නේ අල්ප වූ බලපෑමකි.
3. සන්නිවේදනයේ නියාමනයන් ලෙස ප්‍රබලව ක්‍රියාත්මක වන්නේ සාම්ප්‍රදායික චර්යාවන් පමණි.
4. සන්නිවේදනයේ වාණිජ පරමාර්ථ හා සමාජ පරමාර්ථ අතර පරතරයන් නැත.
5. පාසල නියාමන ආයතනයක් නොවේ.

28. සන්නිවේදන ඉතිහාසය තුළ සිදුවූ ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.
A. කතා කිරීම ආරම්භ කිරීම.
B. ලේඛනය ආරම්භ වීම.
C. අකුරු නිර්මාණය කරගැනීම
D. මුද්‍රණය ආරම්භ කිරීම.
E. කඩදාසිය සොයා ගැනීම.
1. A, B, C, D, E 2. A, C, E, B, D 3. B, A, D, E, C
4. A, E, C, B, D 5. A, C, B, E, D

29. ඉගෙනීම යනු,
1. දිගුකාලීන මතකයට තොරතුරු ඇතුලත් කරගැනීමයි.
2. ගැටලුවක් නිරාකරණයට අවශ්‍ය සාධක තෝරාබේරා වෙන් කරගැනීමේ හැකියාවයි.
3. පුද්ගලයා පරිසරය හා ගැටෙමින් ලබාගන්නා අත්දැකීම් අනුව ගොඩනගා ගන්නා දෙයකි.
4. පාසල් අධ්‍යාපනයට සීමා වූ ක්‍රියාකාරකම් සමුදායකි.
5. දැනුම, භාවිතය හෝ අත්දැකීම් හෝ ඔස්සේ සිදුවන චර්යාමය වෙනසයි.

30. 'ස්ව - සංකල්පය යනු, පුද්ගලයෙකු තම හැකියාවන්, පෙනුම හා සමාජ පිළිගැනුම පිළිබඳ දරනු ලබන ආකල්ප, හැඟීම් හා දැනුම වේ' යනුවෙන් නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
1. රෝජර්ස්ය. 2. රැල්ෆ් ලින්ටන්ය. 3. විල්බර් ශ්‍රාම්ය.
4. බර්න් ය. 5. පර්කි ය.

31. සමාජයක බල කේන්ද්‍රණයට හේතු වී ඇත්තේ,
1. අධ්‍යාපන මට්ටමයි. 2. දේශපාන බලයේ හිමිකාරීත්වයයි. 3. සම්පත් හිමිකමයි.
4. සම්පත් හිඟකමයි. 5. ඇමරිකානු සමාජ විද්‍යාඥයින්ගේ වර්ගීකරණයයි.

32. ශ්‍රවණ නිපුණතා සංවර්ධනයේදී ශ්‍රවණය අවස්ථා හතරක් ඔස්සේ පෙළ ගස්වනු ලබයි. නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
1. ඇසීම ⟶ ඇගයීම ⟶ ආචාරශීලිත්වය ⟶ ප්‍රතික්‍රියා
2. තේරුම් ගැනීම ⟶ ඇගයීම ⟶ විශ්ලේෂණය ⟶ ප්‍රතික්‍රියා
3. ඇසීම ⟶ තේරුම් ගැනීම ⟶ ඇගයීම ⟶ ප්‍රතික්‍රියා
4. ඇසීම ⟶ නිරීක්ෂණය ⟶ තේරුම් ගැනීම ⟶ ප්‍රතික්‍රියා
5. ඇසීම ⟶ අධීක්ෂණය ⟶ තේරුම් ගැනීම ⟶ ඇගයීම

33. 'ජනමාධ්‍යකරුවන් දේශපාලන ක්‍රියාකාරීන් ලෙසද කටයුතු කළ යුතුය'' යන අදහස අවධාරණය කරනු ලබන සංකල්පය නම්,
1. සමාජ වගකීම් සංකල්පයයි. 2. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයයි.
3. නිදහස් මතවාදී සංකල්පයයි. 4. සෝවියට් කොමියුනිස්ට් සංකල්පයයි.
5. අධිපතිවාදී සංකල්පයයි.

34. බර්ලෝ ආකෘතිය පිළිබඳව අදහස් කිහිපයක් පහත දැක්වේ.
A. S.M.C.R. ආකෘතිය ලෙස හඳුන්වයි.
B. සන්නිවේදන ක්‍රියාවලියේ චක්‍රිය බව පෙන්වා දෙයි
C. ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් දැක ගත හැකිය.
D. බලපෑම පිළිබඳව සඳහන් කරයි.
E. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර පවතින සමාන ලක්ෂණ පෙන්වා දෙයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1. A, C පමණි. 2. A, B,C,D පමණි. 3. A, E පමණි.
4. A, B, C, D, E යන සියල්ලම 5. B, C, D පමණි.

35. පහත දැක්වෙන ක්‍රම අතරින් දැනුම ගවේෂණය කිරීමේ ක්‍රමවේදයක් නොවන්නේ,
1. තර්කණය 2. අධිහාරය 3. නිරීක්ෂණය
4. පරිකල්පනය 5. අනුමානය

36. සමාජ ප්‍රභවය හා විකාශනය පිළිබඳ අදහස් කිහිපයක් ලෙස,
A. සමාජය යනු ගතික සංවිධානයකි.
B. සමාජයේ ප්‍රභවයට හා විකාශනයට සන්නිවේදනය ද ප්‍රබලව හේතුවිය.
C. ක්‍රමික මෙන්ම අක්‍රමික විකාශනය ද සමාජ විකාශනයේ ස්වභාවික සංසිද්ධියකි.
D. ක්‍රමික මෙන්ම අක්‍රමික විකාශනය ද සමාජ විකාශනයේ දක්නට නොලැබේ.
1. A, B පමණි. 2. A, C පමණි. 3. A, B, C පමණි.
4. B, C, D යන සියල්ලම 5. A, B, C, D පමණි.

37. තාර්කික චින්තනය යනු,
1. හැඟීම් හා සිතුවිලි පාලනය කරමින් චිත්ත ඒකාග්‍රතාවයට ළඟා වීමයි.
2. තම කෙබඳු පුද්ගලයෙකු ද යන්න මැනවින් හඳුනා ගැනීමයි.
3. තමන් විසින් තමන් ව සංජානනය කරගැනීමයි.
4. විකල්ප, තීරණවලට එළඹීමයි.
5. ගැටළුවක් නිරාකරණයට අවශ්‍ය සාධක තෝරා බේරා ගැනීමයි.

38. ජීව භාෂාවක් සම්බන්ධව සදොස් ප්‍රකාශය වනුයේ,
1. ජීව භාෂාවේ වචනවලට නව අර්ථ ජනනය වේ.
2. ජීව භාෂාවේ වචනවල අර්ථයන් භාවිතය අනුව වෙනස් වේ.
3. වඩාත් සංවේදි ලෙස නිර්මාණශිලි ලෙස අදහස් ප්‍රකාශ කළ හැකිය.
4. ලෝකයේ භාවිතා වන සියලුම භාෂා වර්තමානයේ ජීව භාෂා ගණයට අයත් ය.
5. ජීව භාෂාවකට අනන්‍ය ලක්ෂණ ඇත.

39. දේශනයකට සවන්දුන් ශිෂ්‍ය පිරිස ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගත්තේ ද යන්න සොයා බැලීමේදී හෙළි වුයේ ශිෂ්‍යයන්ගෙන් 50% ක් පමණ දේශනයේ අන්තර්ගතය මනාව තේරුම්ගෙන නැති බවයි. මෙම තත්ත්වය වඩාත් පැහැදිලි කෙරෙන්නේ,
1. මාධ්‍ය සාක්ෂරතාව මගිනි.
2. සංජානනය මගිනි.
3. සමාජ ඒකාබද්ධතාව මගිනි.
4. මාධ්‍ය සංස්කෘතිය මගිනි.
5. අන්තර් මනෝභාව විශ්ලේෂණය මගිනි.

40. රූපවාහිනි වැඩසටහන් පිළිබඳ දර්ශක (Ratings) මූලික වශයෙන් පදනම් වන්නේ,
1. ප්‍රේක්ෂක සංඛ්‍යාව අනුවය.
2. වැඩසටහනේ කාල ප්‍රමාණය අනුවය.
3. වැඩසටහනේ වියදම අනුවය.
4. ඊට සම්බන්ධ වු නළු නිළි සංඛ්‍යාව අනුවය.
5. වැඩසටනේ ආදායම අනුවය.

41. මහජන සම්බන්ධතා සැලසුම් කෙටුම්පතක් පෙර ඇගයීමට ලක් කිරීම අවශ්‍ය වන්නේ,
1. සැලැස්මෙහි ආකෘතිමය දෝෂ නිවැරදි කරගැනීම සඳහාය.
2. සැලැස්ම අනුමත නොවීමේ අවස්ථා අවම කරගැනීම සඳහා ය.
3. සෙසු පාර්ශවකරුවන්ගේ කැමැත්ත දිනාගැනීමේ උපායක් වන නිසාය.
4. මහජන සම්බන්ධතා සැලැස්ම සාමුහික සැලැස්මක් වීම අත්‍යාවශ්‍ය වීම නිසා ය.
5. ක්‍රියාත්මක වූ පසු ඇගයීමට අවස්ථාවක් නොලැබෙන නිසා ය.

42.




ඉහත සටහනින් දැක්වනුයේ,
1. ප්‍රවර්ධන මිශ්‍රයයි.
2. පරිභෝජන මිශ්‍රයයි
3. අලෙවිකරණ මිශ්‍රයයි.
4. ප්‍රාග්ධන මිශ්‍රයයි.
5. මහජන සම්බන්ධතා ස්වරූපයයි.

43. මහජන සම්බන්ධතා මෙවලමක් නොවන්නේ,
1. මුද්‍රිත මාධ්‍ය
2. ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය
3. පාරිසරික මෙවලම්
4. ඡායාරූප
5. සංවිධාන

44. පුද්ගලික ආයතනයක අභ්‍යන්තර මහජන සම්බන්ධතාව ඵලදායි ලෙස පවත්වාගෙන යාමේ දී වඩාත් වැදගත් වන්නේ,
1. අත් පත්‍රිකා, නිවේදන, පෝස්ටර් හා දැන්වීම්ය.
2. සෞඛ්‍ය දීමනා, වැටුප් වර්ධක හා ගමන් ගාස්තු ගෙවීමයි.
3. වෘත්තීය සමිති, ක්‍රීඩා සමිති හා විනෝද චාරිකා ය.
4. සුහද හමු, අභිප්‍රේරණ වැඩසටහන් හා විනෝද චාරිකා ය.
5. තාක්ෂණික රැස්වීම්, කමිටු රැස්වීම් හා වැඩමුළු ය.

45. නැගී එන ක්‍රිකට් ක්‍රීඩකයෙකුගෙන් පෝෂණ දැන්වීමක් සඳහා අනුග්‍රහය කිසියම් ආයතනයක් විසින් ලබා ගත්තේ නම්, එයින් ආයතනය බලාපොරොත්තු වන්නේ,
1. දක්ෂ, සමබර පෞරුෂ ලක්ෂණ සපිරි ක්‍රීඩකයෙකු බිහි කිරීමයි.
2. ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතියයි.
3. තම ආයතනයේ කීර්ති නාමය ඉහළ දමා ගැනීමයි.
4. තම රටට ජාත්‍යන්තර කීර්තියක් අත්පත් කර දීමයි.
5. ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධ උපකරණ ගෙනවිත් අළෙවි කිරීමයි.

46. දැනුම් සමාජය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. බටහිර අනාගතවාදී සංකල්පය තුළ දැනුම් සමාජය බිහිවීමයි.
2. නිර්බහුජනීය විඥාපන මාධ්‍යන් වැදගත් වීමයි.
3. ජාතික රාජ්‍යයන් දුර්වල වීම දැනුම් සමාජය සංවර්ධනය කෙරෙහි ප්‍රබලව බලපෑමයි.
4. මානව ජීවන ශෛලීන් ප්‍රබල වෙනසකට ලක්වීමයි.
5. මිනිස් චින්තනය සුවිශේෂී ලෙස නව දිශාවෙන් කෙරෙහි යොමුවීමයි.

47. තමා අයත් වන සමාජය අපේක්ෂා කරන ආකාරයට තම සමාජ ජීවිතයේ විවිධ අවස්ථාවන් හැඩගස්වා ගැනීම හඳුන්වන්නේ,
1. ඥාන ගවේෂණය ලෙසයි.
2. සමාජානුයෝජනය ලෙසයි.
3. ස්ව-සංකල්පය ලෙසයි.
4. ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥාණය ලෙසයි.
5. තදාත්මීකරණය ලෙයසි.

48. විවිධ නව අදහස් හා සොයා ගැනීම් එක් වෙමින් සංස්කෘතියක් වෙනස් වීම හෝ වැඩි දියුණු වීම වේගවත් වීම හඳුන්වනු ලබන්නේ,
1. සංස්කෘතික හුවමාරුව ලෙසය.
2. සංස්කෘතික ත්වරණය ලෙසය.
3. සංස්කෘතික රාශිකෘතිය ලෙසය.
4. සංස්කෘතික සම්පර්කය ලෙසය.
5. සංස්කෘතික ලැග්ම ලෙසය.

49. රූපවාහිනි මාධ්‍යයෙන් විකාශනය වන ''ජාතික පාසල ''තක්සලාව'' අපේ ගණිත පංතිය' වැනි වැඩසටහන් ඉදිරිපත් කිරීම තුළින් ඉටු කරනු ලබන සන්නිවේදන කාර්යයය වන්නේ,
1. මතවාදී කාර්යයයි.
2. විනෝදාස්වාද සම්පාදනයයි.
3. සංස්කෘතික කාර්යයයි.
4. අධ්‍යාපන කාර්යයයි.
5. සමාජ සංවිධානමය කාර්යයයි.

50. ඕනෑම සමාජයක් ගොඩනැගී ඇති ප්‍රධාන අංශ දෙක වන්නේ,
1. ආර්ථික අංශය හා දේශපාලනික අංශයයි.
2. කාර්මික අංශය හා සේවා අංශයයි.
3. ප්‍රජාමූල අංශය හා ව්‍යාපාරමූල අංශයයි.
4. ව්‍යාපාර මූල අංශය හා ආර්ථික මූල අංශයයි.
5. ආර්ථික අංශය හා සමාජීය අංශයයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

29 S II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) සන්නිවේදනය පිළිබඳ ක්ලෝඩ් ෂැනෝන් සහ වොරන් වීවර්ගේ නිර්වචනය දක්වන්න. (ල. 2)

(ii) අවිධිමත් සන්නිවේදනයේ සම්භාවිතා දාමය හා පර්ශද දාමය ඇඳ, එහි මූලික වෙනස්කම් කෙටියෙන් දක්වන්න. (ල. 4)

(iii) සන්නිවේදනයේ නියාමනය සිදුවන ආකාර තුනක් විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ල. 6)

(iv) රටක සංවර්ධන සන්නිවේදන සංකල්පය ක්‍රියාත්මක වන විට ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය උපයෝගී කරගත හැකි ආකාරය පිළිබඳව උදාහරණ සහිතව විග්‍රහ කරන්න. (ල. 8)

02. (i) සමාජයේ ක්‍රමික විකාශනය තුළ දක්නට ලැබෙන සමාජ අදියර හතරක් නම් කරන්න. (ල. 2)

(ii) මහජන ප්‍රවෘත්ති වාර්තාකරණයේ අහිතකර සාමාජීය බලපෑම් හතරක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) පහත මාතෘකා අතුරින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

a. ආචාරශීලිත්වය

b. ජීව භාෂා

c. විවරණය

d. ජනමාධ්‍ය භාෂා භාවිතයේ සීමා (ල. 6)

(iv) ප්‍රශස්ත තීරණයක් ගැනීමේ පියවරයන් උදාහරණයක් ඇසුරින් විග්‍රහ කරන්න. (ල. 8)

03. (i) ආයතනයට මහජන සම්බන්ධතා කටයුතු සඳහා යොදාගතහැකි මෙවලම් දෙකක් සහ විධි දෙකක් දක්වන්න. (ල. 2)

(ii) ආයතනයක මහජන සම්බන්ධතා ප්‍රවර්ධන ක්‍රියාවලියේදී පාරිසරික මෙවලම් භාවිතය තුළ සැලකිලිමත් විය යුතු කරුණු හතරක් දක්වන්න. (ල. 4)

(iii) සංස්කෘතික හුවමාරුව සමාජීය වශයෙන් ඵලදායි වන ආකාරය පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 6)

(iv) මාධ්‍ය සංස්කෘතියේ බලපෑම හේතු කොටගෙන පවත්නා සංස්කෘතිය වෙනස්වන ආකාරය වර්තමාන සමාජ පරිසරය ඇසුරින් විග්‍රහ කරන්න. (ල. 8)

04. (i) පුවත්පත් භාෂා භාවිතයේදී අවධානය යොමු කලයුතු කරුණු 04 ක් දක්වන්න. (ල. 2)

(ii) සමුහ සන්නිවේදන ක්‍රියාවලියට අදාලව උපකරණ භාවිතයේදී යොදාගත හැකි

- කථන සන්නිවේදන උපකරණ දෙකක්
- ප්‍රක්ෂේපණීය නොවන සන්නිවේදන උපකරණ දෙකක් දක්වා, ඒවායින් ඕනෑම දෙකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) පුද්ගලයා සමාජානුයෝජනය වන ආකාර හතරක් දක්වා න්‍යෂ්ටික පවුලේ හා විස්තෘත පවුලේ සමාජානුයෝජන ක්‍රියාවලියේ ස්වභාවය විස්තර කරන්න. (ල. 6)

(iv) රූපවාහිනී මාධ්‍ය නිවේදකකරණය තුළ භාෂා භාවිතයේදී සැළකිලිමත්විය යුතු කරුණු හතරක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 8)

05. (i) ශ්‍රව්‍ය සන්නිවේදනයේ දේශීය අර්ථ දෙකක් සහ විදේශීය අර්ථ දෙකක් දක්වන්න. (ල. 2)

(ii) සමාජීය සම්පත් හා බලකේන්ද්‍රණ ක්‍රියාවලිය තුළ සමාජයක දැකිය හැකි ප්‍රධාන ව්‍යුහාත්මක ස්වරූප දෙක පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) පුද්ගලයා තුළ දුර්වල ශ්‍රවණ හැකියාවට මූලික වියහැකි හේතු හතරක් දක්වා, ශ්‍රවණ නිපුණතා සංවර්ධනයට ගත හැකි පියවර දෙකක් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ගෝලීයකරණ සංකල්පය තුළ ලාංකේය ජන සමාජය ක්‍රමයෙන් වෙනස්වෙමින් පවතින ආකාරය ''ගෝලීයකරණයේ සන්නිවේදන ප්‍රවණතා'' හතරක් අසුරින් විග්‍රහ කරන්න. (ල. 8)

06. (i) මහජන සම්බන්ධතා භාවිතය පිළිබඳව ශ්‍රී ලංකික ඉතිහාසය ඇසුරින් උදාහරණ හතරක් දක්වන්න. (ල. 2)

(ii) සන්නිවේදනයේ කාර්යයන් හතරක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) ජන සන්නිවේදනයේ ප්‍රධාන ලක්‍ෂණ තුනක් විස්තර කරන්න. (ල. 6)

(iv) වර්තමානයේ යම් පෞද්ගලික ගුවන් විදුලි නාලිකා තුළ භාෂා භාවිතයේ නොගැලපීම් හා අසම්මතයන් පිළිබඳව බොහෝ සමාජීය කතිකාවත් ගොඩනැගෙමින් පවතී. මෙම තත්ත්වය පිළිබඳව කාලීන විවරණයක් ගොඩනගන්න. (ල. 8)

07. (i) නව සමාජ හර පද්ධතීන් හා අර්ථ සමාජගත කිරීමට දායකවන ජනමාධ්‍යවේදීය ශෛලීය කුමක්ද? (ල. 2)

(ii) ඥාන ගවේෂණය පිළිබඳ අර්ථකථනයක් දක්වා ඊට යොදාගන්නා ශිල්ප ක්‍රම හතරක් දක්වන්න. (ල.4)

(iii) නව මාධ්‍ය භාෂා භාවිතයේ ලක්‍ෂණ හතරක් දක්වා එතුළින් සම්මත භාෂාව අභියෝගයකට ලක්විය හැකි ආකාරය විස්තර කරන්න. (ල. 6)

(iv) දිනෙන් දින ඉහල යන මාර්ග අනතුරු පිළිබඳව සති අන්ත පුවත්පතකට සංස්කාරක වැකියක් (Editorial) ලියන්න. (ල. 8)

## තෙවන වාර පරීක්ෂණය - 2018 - 12 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I කොටස


### පිළිතුරු පත්‍රය


| | | | | |
|---|---|---|---|---|
| **01.** - 4 | **11.** - 3 | **21.** - 4 | **31.** - 3 | **41.** - 2 |
| **02.** - 3 | **12.** - 1 | **22.** - 5 | **32.** - 3 | **42.** - 3 |
| **03.** - 1 | **13.** - 4 | **23.** - 1 | **33.** - 4 | **43.** - 5 |
| **04.** - 5 | **14.** - 4 | **24.** - 4 | **34.** - 4 | **44.** - 4 |
| **05.** - 3 | **15.** - 1 | **25.** - 4 | **35.** - 2 | **45.** - 3 |
| **06.** - 1 | **16.** - 1 | **26.** - 3 | **36.** - 3 | **46.** - 3 |
| **07.** - 3 | **17.** - 4 | **27.** - 1 | **37.** - 5 | **47.** - 2 |
| **08.** - 4 | **18.** - 5 | **28.** - 5 | **38.** - 4 | **48.** - 2 |
| **09.** - 4 | **19.** - 1 | **29.** - 5 | **39.** - 2 | **49.** - 4 |
| **10.** - 2 | **20.** - 1 | **30.** - 4 | **40.** - 1 | **50.** - 3 |

## II කොටස පිළිතුර

01. (i) සන්නිවේදනය යනු යම් තැනක නිර්මාණය වු හෝ තොරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන්ම හෝ සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය වීමයි. (ල. 2)

(ii)




සම්භාවිතා දාමයේදී අයෙකු යම් පිරිසකට තොරතුරු ලබාදෙන අතර, ඔවුන් ද , සමාන පිරිසකට තොරතුරු ලබා දේ. පර්ෂද දාමයේදී ඊට සමාන ක්‍රියාවලියක් සිදු වුවද, ඔවුන් තොරතුරු ලබා දෙන්නේ නිෂ්චිත සම්බන්ධතා සහිත පිරිසකට පමණි.

ඇඳීමට ල. 2 , කෙටි පැහැදිලි කිරීම ල. (1x2 = 2) (ලකුණු 4)

(iii) සාම්ප්‍රදායික චර්යාවන් (ආගමික සංස්ථා, පවුල ආදිය)
නව නියාමක සංවිධාන (විදුලි සංදේශ සේවා නියමන කොමිෂන් සභා, රූගුම් පාලක මණ්ඩලය ආදිය)
මධ්‍ය ආයතනික මට්ටමේ නියාමනය (සමීක්ෂණ වාර්තා, දත්ත පදනම් ආදිය)
ග්‍රාහක මට්ටමේ නියමනය (මාධ්‍ය සාක්ෂරතාවය හා මාධ්‍ය අධ්‍යාපනය අනුව සාපේක්ෂව සිදුවන නියාමනය)
ඉහත කරුණු පිළිබඳව විස්තරාත්මක පැහැදිලි කිරීම් අවශ්‍යය. (ලකුණු 2 x 3 = 6)

(iv) මිනිසා පරිසරය හා ගැටෙමින් කාලාන්තරයක් ජීවත්වෙමින් ලබා ගන්නා දැනුම් සම්භාරය තුළින් තීන්දු තීරණ ගැනීමේ හා අනාවැකි පලකිරීමේ හැකියාව ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර් ඥානයයි.

- ග්‍රාමීය මට්ටමේ සංවර්ධනය ව්‍යාපෘති
- ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධනය ව්‍යාපෘති
- පලාත්බද හා ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති

ආදී වශයෙන් ව්‍යාපෘති සැලසුම්කරණයේදී මෙම දැනුම් භාවිතය පිළිබඳව සුදුසු උදාහරණ සහිතව විග්‍රහ කර තිබීම අවශ්‍යය. (ල. 08 එකතුව 20)

02. (i) ප්‍රාථමික සමාජ , ධනවාදී සමාජ, ගෝත්‍රික සමාජ, වහල් සමාජ, ප්‍රජාතන්ත්‍රවාදී සමාජ, සමාජවාදී සමාජ, වැඩවසම් සමාජ, දැනුම් සමාජ. (ල. 4 x 1/2 = 2)

(ii) 1. පෞද්ගලිකත්වයට හා පුද්ගල පෞරුෂයට හානි සිදුවීම.
2. යම් තොරතුරු පිළිබඳ වගකීම් රහිත බව
3. බොහෝ තොරතුරු පිළිබඳ හා ඒවායෙහි මුලාශ්‍ර පිළිබඳ අපැහැදිලි බව.
4. අවිධිමත් තොරතුරු සමාජීය, ආගමික, සංස්කෘති ආදී ගැටුම් ඇතිවීමට මුල් වීම.
5. සදාචාරාත්මක නොවන සංදේශ සමාජගත වීම.
6. ජනවාර්ගික අර්බුධ ආදියට මුල්වීම.
7. අසත්‍ය තොරතුරු තුළින් සමාජය තුළ විවිධ ප්‍රශ්න හා ගැටුම් උත්සන්න වීම.
(ඉහත කරුණු වලට අමතර ව අදාල වන පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබා දිය හැකිය) (ල. 4 x 1/2x = 4)

(iii) a - සමාජගත සම්බන්ධතා පිළිබඳව සමාජය තුළ ඇති පිළිගැනීම හා පුද්ගලයා විසින් එය අනුමත කරන ස්වභාවය ආචාරශිලිත්වයේ පදනමයි.
b - සන්නිවේදන කාර්යයේ යොදාගන්න සහ දැනට ප්‍රායෝගික භාවිතයේ පවත්නා භාෂාවක් ජීව භාෂාවක් වේ.
c - එය අඛණ්ඩව භාවිතා වීම, නිරන්තරයෙන් පෝෂණය වීම වැනි ලක්ෂණ 04 ක් පමණ දක්වා තිබීම ප්‍රමාණවත් ය.
d - යමක් පිළිබඳව භාෂාව උපයෝගී කරගනිමින් විස්තර කිරීම, විවරණයයි. (මාධ්‍ය සංදේශ පිළිබඳ විග්‍රහයේදී එය විචාරය ලෙස හැඳින්වේ.)

e - පුවත්පතක ඉඩකඩ, ගුවන් විදුලියේ, ගුවන් කාලය, ප්‍රාදේශීය ව්‍යවහාර, උපභාෂා ආදී ග්‍රාහක සීමාවන්ද, සදාචාරාත්මක ආගමික හා සංස්කෘතික සීමාවන්ද ආදී වශයෙන් විස්තර කර තිබීම අවශ්‍යය.

(ල. 2 x 3 = 6)

(iv) •ගැටළුවක් ඇති බව හඳුනාගැනීම.
•ගැටළුවේ සැබෑ ස්වභාවය විශ්ලේෂණය හා අධ්‍යයනය කිරීම.
•තීරණයක් ගැනීමේ අවශ්‍යතාව නිගමනය කිරීම.
• විකල්ප තීරණ කිහිපයක් ගොඩ නංවා ගැනීම.
• විකල්ප තීරණ තක්සේරු කිරීම.
•තීරණ ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාව මැන බැලීම.
• වඩාත් යෝග්‍ය තීරණය ගැනීම.

ඉහත පියවරයන් සුදුසු උදාහරණයක් මගින් විස්තර කර තිබීම අවශ්‍යය. (ල. 08) එකතුව 20

**(පියවර 07 ක් පමණක් දක්වා ඇත්නම් ල. 04 )**

03. (i) මෙවලම් - මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය, ඡයාරූප, ප්‍රදර්ශන, පාරිසරික මෙවලම්
විධික්‍රම - මාධ්‍ය සම්බන්ධතා, අනුග්‍රාහකත්වය (1/2 x 4 = 2)

(ii) 1. ස්වභාවික පරිසරයේ ඕනෑම දෙයක් නිර්මාණාත්මක ලෙස යොදාගත හැකිබව.
2. ආයතනික අරමුණු ඉටුවන ආකාරයට සකස්කිරීම.
3. ස්වභාවික පරිසරයට හානියක් නොවන ලෙස යොදා ගැනීම.
4. අවම පිරිවැයක් සහිතව යොදා ගැනීමට කටයුතු කිරීම.

(ඉහත පිළිතුරු වලට අමතරව අදාල වන පිළිතුරු ලබා දී ඇත්නම් ලකුණු ලබා දිය හැකිය) (ල.1 x 4 = 04)

(iii) යම් සංස්කෘතියක ඵලදායි සංස්කෘතිකාංග වෙනත් සංස්කෘතියක් විසින් කැමැත්තෙන් භාර ගැනීම සංස්කෘතික හුවමාරුවයි.
- සමාජීය සංහිඳියාවට සහ සහයෝගීතාවයට ඵලදායි වන බව.
- ජාත්‍යන්තර සහයෝගීතාවයට සහ එකමුතු බවට උපකාරී වන බව
- සැලසුම් සගහත ලෙස හෝ සැලසුමකින් තොරව සිදුවුවද, සමාජයට ඵලදායී වන බව.
- සමාජීය සංවර්ධනයට උපකාරී වන බව.
- හුවමාරුව තුලින් එක්වන සංස්කෘතිකාංග සමාජ ප්‍රගමනයට යොදාගත හැකි බව.
- චිත්‍රපට, නාට්‍ය, ක්‍රීඩා, ජනශ්‍රැති ආදී ඕනෑම අංගයක් ඔස්සේ සංස්කෘතික හුවමාරුව සිදුවිය හැකිබව. (ල. 6)

(iv) මිනිසා උපතින් අයත් වන සමාජ රටාව හා ජීවත් වන පරිසරය හා බැඳී ජීවන රටාව පවත්නා සංස්කෘතියයි. මාධ්‍ය මගින් මුදාහරිනු ලබන සංදේශ හේතු කොටගෙන පවත්නා සංස්කෘතිය වෙනස් වීමෙන් හටගන්නා රූපකාය මාධ්‍ය සංස්කෘතියයි.
සිරිත්විරිත්, චර්යාරටා, ජීවනෝපායයන්, ආගමදහම, අධ්‍යාපනය, මානව ධර්මතා, සමාජ හර පද්ධති, සංවේදී චර්යාවන් ආදි සියල්ල මාධ්‍ය සංස්කෘතිය මගින් මුදාහරිනු ලබන සංදේශ හේතු කොටගෙන සමාජය තුළ වෙනස්වන ආකාරය විග්‍රහත්මක ලෙස විස්තර කර තිබීම අවශ්‍ය. (ල. 8) (එකතුව 20)

04. (i)
- ඉඩකඩ සීමා සහිත බව
- කෙටි හා සරල වීම.
- පොදු සමාජයට උචිත භාෂා භාවිතය
- ඉලක්ක කණ්ඩායම් පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම.
- සාම්ප්‍රදායික භාෂා භාවිතයට වඩා වෙනස් භාෂා භාවිතය. (ල.1 x $\frac{1}{2}$ = 02)

(ii) කථන සන්නිවේදනය උපකරණ
- රැහැන් සහිත මයික්‍රෆෝන
- රැහැන් රහිත මයික්‍රෆෝන
- කොලර් මයික්‍රෆෝන
- ක්ලිප් මයික්‍රෆෝන
- හෙඩ්ෆෝන් මයික්‍රෆෝනය

ප්‍රක්ෂේපණීය නොවන සන්නිවේදන උපකරණ
- කළු ලෑල්ල, සුදු ලෑල්ල, කොල ලෑල්ල, ප්ලෑනල් හුවරුව, මැග්‍රී පුවරුව

දෙකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කිරීම අවශ්‍ය ය. නම් කිරීම ලකුණු
(1/2 x 4 = 02) පැහැදිලි කිරීම (1 x 2 = 02) (ල. 04)

(iii) පවුල, ආගමික ආයතන, පාසල, සම වයස් කණ්ඩායම්
න්‍යෂ්ටික පවුලේ සමාජානුයෝජන ක්‍රියාවලිකට වඩා විස්තෘත පවුලේ සමාජානුයෝජන ක්‍රියාවලිය ප්‍රබල බව, වර්තමානයේ රූපවාහිනියද ප්‍රබල සමාජානුයෝජන කාර්යයක් ඉටු කරන බව. එය න්‍යෂ්ටික පවුල් පරිසරය තුළ ප්‍රබල, යහපත් සමාජානුයෝජන ක්‍රියාවලියක් සිදු නොවන බව, ආදී වශයෙන් යෝග්‍ය පිළිතුර ගොඩ නැගී තිබිය යුතුය. (ල. 6)

(iv) 1. අදහස් ගොඩ නැගෙන්නේ ශ්‍රව්‍ය දෘෂ්‍ය සංකලනය වීමෙන් බව.
2. ශිල්පියා දෘෂ්‍යමය වශයෙන් පෙනී සිටින බැවින් භාෂා භාවිතය සමඟ නිර්වාචික සන්නිවේදනය ද සුසංයෝජනය විය යුතු බව.
3. දෘෂ්‍ය මාධ්‍ය ප්‍රබල බැවින් භාෂාව තුළින් රූපයට හානියක් නොවිය යුතු බව.
4. නිවේදනයාගේ හඬ පෞරුෂය, ප්‍රසන්න බව ආදී ලක්ෂණ ගැලපිය යුතු බව.
5. වැඩ සටහනට උචිත ලෙස භාෂාව සකස් කර ගත යුතු බව.
6. අවස්ථානුකූල බව හා කාලානුරූප භාෂා භාවිතය.

ඉහත කරුණු වලට සමාන ලක්ෂණ ඇත්නම් සහ ඒවා විස්තර කර ඇත්නම් ලකුණු ලබාදිය හැකිය.

(ල. 2 x 4 = 08) එකතුව 20

05. (i) දේශීය අර්ථ (උදා:-)
- පන්සලේ සන්ධ්‍යාව, උළමා වැනි සතුන් කෑගැසීම.

විදේශීය අර්ථ (උදා:-)
- සයිරන් නලාව, පල්ලියේ සීනුහඬ (1/2 x 4 = 02)

(ii) • උපරි ව්‍යුහය, අධෝ ව්‍යුහය

කලාව, රාජ්‍ය, ආගම්, දේශපාලනය ආදිය උපරිව්‍යුහය තුළ ඇති බව. නිෂ්පාදන බලවේග රාජ්‍ය ප්‍රතිපත්ති ආර්ථික සැලසුම් ආදිය අධෝව්‍යුහය තුළ ඇති බව ආදි වශයෙන් සරල විග්‍රහයක් අවශ්‍යය.

නම් කිරීම ල. 02 , පැහැදිලි කිරීම ල. 02 (ල. 04)

(iii) දුර්වල ශ්‍රවණයට හේතු (උදා:)
- අවශ්‍යතාවයක් නොමැති වීම.
- නිසි අවධානයක් නොමැති වීම.
- සංජානනය දුර්වල වීම.
- උපතින් හෝ පසුකාලිනව ඇති වන ශ්‍රවණ ආබාධ

ශ්‍රවණ නිපුණතා සංවර්ධනයට ගත හැකි පියවර (උදා:)
- ශ්‍රවණය වන දෑ පිළිබඳව ඇල්මක් ඇති කර ගැනීම.
- අවට පරිසරය පිළිබඳ නිරන්තතර අවධානය, ශ්‍රවණය වන දෑ හැකිතාක් මතකයෙහි රඳවා ගැනීමට උත්සහ දැරීම.
- මානසික ඒකාග්‍රතාවය සහ සිත හසුරුවා ගැනීම.

වැනි ලක්‍ෂණ 02 ක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දිය හැකිය.

නම් කිරීමට (1/2 x 4 = 02) විස්තර කිරීම. (2 x 2 = 04) (ල. 6)

(iv)
- ජන සන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනය
- ජන මාධ්‍ය ක්‍රියාවලිය තුළ විවිධ සංඝටක වර්ධනය
- විවිධ ජන මාධ්‍ය ඒකීය පද්ධති බවට පත්වීම.
- ගෝලීය තොරතුරු අවකාශයක් නිර්මාණය වීම.
- සංස්කෘතික ක්ෂේත්‍රය තුළ ජනමාධ්‍යයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනය
- ජන මාධ්‍යයට අමතරව ආත්මකේන්ද්‍රීය මාධ්‍ය බිහිවීම.
- නූතන මාධ්‍ය හා නව මාධ්‍ය අතර සබඳතා වර්ධනය වීම.
- බහුජන තොරතුරු අවකාශය වානිජකරණය වීම.

ඉහත කරුණු වලින් 04 ක් පිළිබඳව උදාහරණ සහිතව විස්තර කර තිබීම අවශ්‍යය. (ල. 8) එකතුව 20

06. (i)
- රාජ්‍ය මට්ටමේ ආගමික උත්සව පැවැත්වීම
- කෘෂිකාර්මික උත්සව සංවිධානය
- රජවරුන් හා පාලකයින් තොරතුරු රැස් කිරීමට වෙස් වලාගෙන සංචාරය කිරීම.
- විවිධ තනතුරු නිලතල නම්බුනාම ආදිය ලබාදීම.

(සමාන වෙනත් කරුණු ඇත්නම් ලකුණු ලබාදිය හැකිය) (1/2 x 4 = 02)

(ii)
- තොරතුරු සම්පාදනය
- අධ්‍යාපනය
- සංස්කෘතික ප්‍රගමනය හා හුවමාරුව
- විනෝදාස්වාද සම්පාදනය / විශ්‍රාන්තිය
- සමාජානුයෝජනය
- පෙළඹවීම
- සංවාද හා සාකච්ඡා කාර්යය
- සමාජ ඒකාබද්ධතාව
- පරිසරය පිළිබඳ සුපරීක්‍ෂණය
- සමාජ උරුමයන් නව පරපුරට පවරා දීම.

නම් කිරීමට (1/2 x 4 = 02) කෙටි පැහැදිලි කිරීමට 02 (ල.04)

(iii)
- මූලික වශයෙන් මාධ්‍ය ත්‍රිත්වය භාවිතාවීම
- ග්‍රාහක පිරිස අවිනිශ්චිත වීම.
- සෑම විටම ආයතනගතව හා සංවිධානාත්මකව සිදුවීම.
- සමස්ථ ජන මාධ්‍ය පරිහරණයට මාධ්‍ය සාක්‍ෂරතාව අවශ්‍ය වීම.
- ඉලක්ක ගත කණ්ඩායමකට සංදේශ ඉදිරිපත් කළ නොහැකිවීම.
- මාධ්‍ය සංදේශ සමාජයට විවෘත බැවින් සමාජයට සිදුවන බලපෑම විශාල වීම.
- පුහුණු මාධ්‍යකරුවන් අවශ්‍ය වීම
- උසස් තාක්‍ෂණයක් හා විශාල පිරිවැයක් අවශ්‍ය වීම.

වැනි කරුණු වලින් 03 ක් විස්තර තිබිය යුතුය. (ල. 2 x 3 = 06)

(iv)
- රාජ්‍ය මාධ්‍ය තුළ භාෂා භාවිතය
- පෞද්ගලික මාධ්‍ය තුළ භාෂා භාවිතය
- භාෂාවේ සම්මතය හා සම්මතය
- පෞද්ගලික ගුවන්විදුලි නාලිකාවෙල වැඩසටහන් හා භාෂා භාවිතයට උදාහරණ

ආදී වශයෙන් යෝග්‍ය උදා: දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය (ල. 8) එකතුව 20

07. (i) • විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය (ල. 2)

(ii) • මිනිසා විසින් ලෝකය අනාවරණය කර ගැනීම ඥාණ ගවේෂණයයි.

ශිල්ප ක්‍රම : • උද්ගාමී හා නිගාමී තර්ක • නිරීක්‍ෂණ • විශ්ලේෂණ • සංස්ලේෂණ • සම්පරීක්‍ෂා

අර්ථ කථනයට (ල. 2) නම් කිරීමට (1/2 x 4 = 02) (ල. 4)

(iii) භාෂා මිශ්‍රවීම, විදේශිය භාෂා වල අක්‍ෂර වලින් දේශීය වචන ලිවීම, ව්‍යාකරණ හා රීති සම්ප්‍රදායයන් පිළිබඳ නොසැලකිලිමත් බව ආදී ලක්‍ෂණ පිළිබඳව විස්තර කර තිබිය යුතුය. (ල. 6)

(iv)
- සුදුසු මාතෘකාවක් යොදා තිබීම.
- ලේඛකයා පිළිබඳ සඳහන් නොවීම
- ඡේද වෙන් කිරීම.
- මුල, මැද, අග සංවිධානාත්මක බව
- භාෂා භාවිතයේ නිරවද්‍යතාව
- නිර්මාණාත්මක ලේඛන රටා

ආදී ලක්‍ෂණ හා මාතෘකාවට අදාලව බව ආදිය සලකා ලකුණු ලබා දිය හැකිය. (ල. 8) එකතුව 20